**මහනුවර කඩවත්සතර සහ ගගවට කෝරලේ ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 07 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය.**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මහනුවර කඩවත්සතර සහ ගගවට කෝරලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් 2014 වර්ෂයේ දී සභාවට ලබා දී තිබූ එහෙත්, අයිතිය පවරා ගෙන නොතිබුණු රු.6,390,000 ක් වටිනා WPPF – 7488 දරන කැබ් රථයේ වටිනාකම ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සභාව නඩත්තු කරනු ලබන ඉඩම් ලේඛනයේ සඳහන් ඉඩම් 19 ක් පිළිබඳව අයිතිය තහවුරු වන ලියවිලි නොතිබූ අතර, එම ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට සහ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු පාලන ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ණය, එම උපලේඛනය අනුව රු.7,175,620 ක් වූ නමුත්, මූල්‍ය ප්‍රකාශනය අනුව, එය රු.7,282,002 ක් වූයෙන්, රු.106,382 ක නොසැසඳීමක් විය.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**

2015 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 06 ක එකතු වටිනාකම රු.124,549,528 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.75,048,169 ක් වී තිබුණි.

**1.3.4 ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂ 03 ක එකතු වටිනාකම රු.95,402,205 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.25,725,125 ක් වී තිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 03 කට අදාළ අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.8,906,670 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල මෝටර් රථ හා කරත්ත යටතේ දක්වා තිබුණු රු.106,910 ක් වටිනා වත්කම් අයිතම 04 ක් භෞතික පරීක්ෂණය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

**පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.**

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති. | |
| | (i) 217 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සඳහා ප්‍රා.ස.46 ආකෘතිය පරිදි ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| | (ii) 218 | සියලු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත (2000 අංක 53 සහ 1988 අංක 56 පනත්වලින් සංශෝධිත) | 2015 දෙසැම්බර් 31 දිනට පරිසර බලපත්‍රවල වලංගු කාලය ඉක්ම වූ කර්මාන්ත 48 ක් වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxxii වැනි පරිච්ඡේදයේ 2:3:4 වගන්තිය. | උප සභාපතිවරයා, දිවි නැගුම සංවර්ධන නිලධාරී ලෙස ඔහු දරමින් සිටි තනතුරෙහි සිටිය දීම සභා රැස්වීම්වලට සහභාගී වීම සඳහා හා එම රැස්වීම් හා අනුබද්ධිත කාර්යයන් හී නිරතවීම සඳහා සේවයේ හදිසි අවශ්‍යතාවයන්ට යටත්ව මසකට දින 05 ක් වැටුප් සහිත නිවාඩු අනුමත කරවා ගතයුතු වුවත්, නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව සභා වාර 13 කට හා කමිටු 26 කට සහභාගී වී තිබුණි. |
| (ඈ) | 2006 මැයි 31 දිනැති අංක මප/ප.පා.දෙ./ව.ලේ.අංක 2006/05 දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | ප්‍රාදේශීය සභා උප සභාපතිවරුන්ට නිල වාහන හා ඉන්ධන සැපයීමට විධිවිධාන සළසා නොතිබිය දී, උප සභාපතිවරයාට වාහනයක් අනුයුක්ත කර ඒ සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් රු.262,053 ක් සමාලෝචිත වැය කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.112,105,283 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.62,949,775 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.49,155,408 ක වැඩිවීමක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------

සමාලෝචිත වර්ෂයේ සමස්ත අතිරික්තය ඉකුත් වර්ෂයේ සමස්ත අතිරික්තය සමග සැසඳීමේ දී, රු.16,089,325 ක අතිරික්තයේ අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා විෂයයන් 04 ක ආදායම් අඩු වීම හා විෂයයන් 02 ක වියදම් වැඩිවීම මූලික වශයෙන් හේතු වී තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

----------------------

#### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

-----------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2015.01.01 දිනට | | 2015 වර්ෂය | | | 2015 ලැබීම් | | | 2015.12.31 දිනට හිග ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | හිග ශේෂය | ඉදිරියට ලැබීම් | බිල් කිරීම් | අධි ගාස්තු | දුන් වට්ටම්/ කපා හැරීම් | ඉදිරියට ලැබීම් | හිගයෙන් ලැබීම් | 2015 බිල් කිරීම්වලින් ලැබීම් | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 8,214,097 | 369,281 | 7,514,256 | 474,465 | 299,153 | 510,266 | 2,711,245 | 4,321,219 | 7,991,653 |
| බදු කුළී | 187,902 | -- | 564,000 | 5,700 | -- | -- | 187,407 | 428,700 | 141,495 |
| බලපත්‍ර ගාස්තු | -- | 2,854,699 | -- | -- | -- | -- | -- | 2,854,699 | -- |
| වෙනත් ආදායම් | 119,649,926 | -- | 45,092,884 | -- | 227,006 | 25,200 | 83,030,349 | 8,708,827 | 72,506,668 |
| එකතුව | | | | | | | | | 80,639,816 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.80,639,816 ක මුළු ආදායමක් හිග හිට තිබුණි

2.3.2 වරිපනම් බදු

-------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.8,199,083 ක හිග ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.7,512,286 ක් විය. වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය හිග ශේෂයෙන් සියයට 33 ක් හා වර්ෂයේ බිල් කිරීම්වලින් සියයට 57 ක් විය. 2015 දෙසැම්බර් 31 දිනට හිග ශේෂය රු.7,975,099 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබූ හිගය රු.5,487,839 ක් විය. මේ අනුව, වරිපනම් බදු අය කිරීමේ දුර්වලතාවයක් නිරීක්ෂණය විය. 2015 දෙසැම්බර් 31 දිනට හිග මුදලින් රු.6,358,828 ක මුදලක් ලැබීමට ඇති බව ලේකම්වරයා 2016 ජුලි 27 දාතමින් මා වෙත වාර්තා කර තිබුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

--------------------------------

2015 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.62,143,620 ක් හා උසාවි දඩ රු.690,918 ක් ලැබියයුතුව තිබුණු අතර, එම ශේෂයෙන් වසරකට වැඩි කාලයක් හිග හිටි ශේෂය රු.36,220,448 ක් වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------

පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 ඔක්තෝබර් 21 දිනැති අංක CPC/CS/05/14/01/18 දරන පළාත් විගණන අධ්‍යක්ෂගේ විගණන වාර්තාවේ 05.02 අනුව WP – LL – 6401 දරන (Foton) ලොරි රථයේ ඉන්ධන ධාරිතාව ඉක්මවා ලබා ගත් රු.51,110 ක් වූ ඩීසල් ලීටර් 538 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 2007 සහ 2009 වර්ෂයන් හී මහනුවර මහා නගර සභාවේ නිලධාරීන් වෙත අවස්ථා 03 කදි ලබා දී තිබූ රු.20,000 ක අත්තිකාරම් මුදලක් 2015 නොවැම්බර් 03 දින දක්වාම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2005 වර්ෂයට පෙර වර්ෂවල සිට පැවත එන විශ්‍රාම වැටුප් දායක අරමුදල වෙනුවෙන් ගෙවියයුතු රු.3,803,483 ක ශේෂය නිරවුල් කිරීමට 2015 දෙසැම්බර් 31 දින තෙක්ම කටයුතු කර නොතිබුණි.

(ඈ) හීරැස්සගල ග්‍රීන් හීල්ස් ඉඩමේ අංක 59 හා 41 දරන පෞද්ගලික ඉඩම්වල ඉදි කර තිබූ ගොඩනැගිලි මාර්ග සීමා නොසළකා ඉදි කර තිබූ අතර, ඒ සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) 2000 වර්ෂයට පෙර සිට පැවත එන රු.274,238 ක හිග සේවක ණය ශේෂ 18 ක් අය කර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) 2013, 2014 හා 2015 ඔක්තෝබර් 28 දක්වා කාල පරිච්ඡේදය තුළ ගොඩනැගිලි අයදුම්පත් 991 ක් ලැබී තිබූ අතර, අනුමත කළ සංඛ්‍යාව 677 කි. අනුමත කළ අයදුම්පත් අතරින් අනුකූලතා සහතික

127 ක් නිකුත් කර තිබුණි. ඒ අනුව, අනුමත සංවර්ධන බලපත්‍ර 550 ක් සම්බන්ධව අනුකූලතා සහතික නිකුත් කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වී නොතිබුණි.

3.2 **අනාර්ථික වියදම්.**

**-------------------**

**චීනයේ පැවති අධ්‍යයන වැඩමුළුව**

**-----------------------------------**

සභාවේ සභාපති, ඇතුළු සභිකයින් 08 දෙනෙකු චීනයේ පැවති අධ්‍යයන වැඩමුළුවකට සහභාගි වීමට සභා අරමුදලින් රු.1,280,000 ක් වැය කර තිබුණි. චීනයේ ගුවාංෂු නගර සභාවේ කැඳවීම් ලිපියකට අනුව, 2015 මාර්තු 18 හා 19 දෙදින වැඩමුළුවක් සඳහා ආරාධනා කර තිබිය දී, මහනුවර, ගුරුදෙණියේ පිහිටි සංචාරක ආයතනයක් 2015 මාර්තු 17 සිට 29 යන දිනයන් හී සංචාරය සංවිධානය කර තිබුණි. එසේ වුවත්, 2015 මාර්තු 28 සිට අප්‍රේල් 03 දින දක්වා දින 07 ක් සංචාරයේ යෙදී තිබූ බව නිරීක්ෂණය වූ අතර, එම වැඩමුළුවෙන් ලද දැනුම උපයෝගී කර ගැනීම සඳහා වාර්තාවක්ද ඉදිරිපත් කර නොතිබුණි.

3.3 **සභාව සතු ඉඩම් බදු දීම.**

**---------------------------**

සභා බල ප්‍රදේශයේ ඉඩම් අනු බෙදුම් කර විකිණීමේ දී සභාවට පවරා තිබූ හීරැස්සගල ග්‍රීන් හිල්ස් ඉඩමේ පර්චර්ස් 47.5 ක ප්‍රමාණය රු.10,000 ක වාර්ෂික බදු මුදලකට වසර 05 කට හා හන්තාන ඩැස්ලින් රේන්ජ් හී ඉඩමේ පර්චස් 54 ක් හා පර්චස් 53 ක ඉඩම් කොටස් 02 ක් රු.12,000 ක වාර්ෂික බදු මුදලකට වසර 05 කට යාබද ඉඩම්හිමියන් දෙදෙනෙකුට බදු දී තිබුණි. මේ සම්බන්ධව පහත කරුණු අනාවරණය විය.

(අ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ (1996 අගෝස්තු 06 දිනැති අංක 935/6 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ (සංශෝධිත) පළ කර ඇති පරිදි) 22(1) වගන්තියට පටහැනිව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1)(X) හා (Xii) වගන්තිවලට අනුව, විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන මෙම ඉඩම් බදු දී තිබුණි.

(ආ) විධිමත් තක්සේරුවක් ලබා ගැනීමකින් තොරව හා ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව සභාවේ සභාපතිවරයා අත්සන් කළ ගිවිසුම් පත්‍රයකින් අදාළ ඉඩම් බදු දී තිබුණි.

(ඇ) අදාළ බදු ගිවිසුමේ 05 වන කොන්දේසිය අනුව ඉඩම තුළ කිසිදු ස්ථිර ගොඩනැගිල්ලක් ඉදි නොකළයුතු වුව ද, හීරැස්සගල ග්‍රීන් හිල්ස් ඉඩම බදු ගෙන තිබූ බදුකරු බදු ඉඩමේ කොටසක් යාවන ලෙස ඔහුගේ හෝටලයේ කොටසක් ඉදි කර තිබූ අතර, ඉඩමේ පහළින් මායිම් තාප්පයක් ඉදි කර තිබුණි.

3.4 **වාහන පාලනය.**

**-----------------**

දිවි නැගුම සංවර්ධන නිලධාරියෙකු ලෙස මහනුවර දිස්ත්‍රික්කයට අනුයුක්තව සේවය කරන උප සභාපතිවරයා 2015 වර්ෂයේ නිවාඩු ලබා ගෙන තිබූ දින 05 හැර ඉතිරි සියලු දිනයන් හී සභාවේ CPPD - 6533 දරන කැබ් රථය ප්‍රාදේශීය සභාවේ කටයුතු සඳහා භාවිතා කළ බවට ධාවන සටහන්වල අත්සන් යොදා අදාළ ගමන් තහවුරු කර තිබුණි. මේ අනුව, දිවි නැගුම සංවර්ධන නිලධාරියෙකු ලෙස සේවය කළ කාල පරිච්ඡේදය තුළ සභාවේ වාහනය විවිධ ගමන් සඳහා යොදා ගෙන තිබුණි. මේ ආකාරයෙන් 2014 දෙසැම්බර් 15 සිට 2015 දෙසැම්බර් 31 දක්වා වූ කාලයට ඉන්ධන, වාහන අලුත්වැඩියා, රියැදුරුගේ වැටුප් හා දීමනා හා ගමන් වියදම් වෙනුවෙන් රු.772,718 ක් සභා අරමුදලින් වැය කර තිබුණි. එම කාල පරාසය තුළ වාහනය භාවිතා කර ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ තහවුරු කිරීම් සභාව සතුව නොතිබූ අතර, ධාවන සටහන්වල වාහනය පාවිච්චි කළ කාර්යය ද දක්වා නොතිබුණි.

## 3.5 අවිධිමත් ගණුදෙණු

----------------------

පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති177 හා 178 නියමයන්ට පටහැනිව විධිමත් ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව රු.2,853,200 ක් වටිනා කාර්යාල උපකරණ, පරිගණක යන්ත්‍ර, වායු සමීකරණ හා පුටු මිල දී ගෙන තිබුණි.

(ආ) පුටු මිල දි ගැනීමේ දී අදාළ භාණ්ඩ තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් පරීක්ෂා කර නොතිබුණි. එසේ වුවත්, වැඩ අධිකාරී විසින් පරීක්ෂා කර, ප්‍රමිතිය පිළිබද සියයට සියයක් සෑහීමකට පත් විය නොහැකි බවට ලිඛිතව කළ දැන්වීම නොසළකා රු.805,800 ක් වටිනා පුටුවලට ගෙවීම් කර තිබුණි.

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනය.

-------------------------

### 3.6.1 ගුරුදෙණිය පිච්චමල්වත්ත පාරේ ගග දෙසට යන කාණුව සංවර්ධනය කිරීම - රු.100,000

------------------------------------------------------------------------------------------

මෙම කර්මාන්තයේ කාණුවේ පතුල අගල් 4 ක් ඝනකමින් හා 1:2:4(මි.මී.19) සිමෙන්ති, වැලි හා ගල් මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් කළයුතු වුවත්, 2015 නොවැම්බර් 06 දින ස්ථාන කිහිපයකින් කඩා පරීක්ෂා කිරීමේ දි එහි පතුලේ ඝනකම අගල් 2 හා 2 ½ ප්‍රමාණයෙන් යුක්ත වූ අතර, කොන්ක්‍රීට් පහසුවෙන් කැඩිය හැකි ඉතා දුර්වල තත්ත්වයක පැවතුන ප්‍රමිතියෙන් තොර ඉදි කිරිම සඳහා රු.100,000 ක් වැය කර තිබුණි.

### 3.6.2 ගුරුදෙණිය පිච්චමල්වත්ත කාණුව සංවර්ධනය කිරීම ආරම්භක කොටස රු.250,000

-------------------------------------------------------------------------------------

(i) මෙම කර්මාන්තයේ කාණුවේ පතුල අගල් 4 ක් ඝනකමින් හා 1:2:4(මි.මී.19) සිමෙන්ති, වැලි හා ගල් මිශ්‍රණයෙන් ඉදි කළයුතු වුවත්, කොන්ක්‍රීට් ස්ථාන කිහිපයකින් කඩා පරීක්ෂා කිරීමේ දි එහි පතුලේ ඝනකම අගල් 2 ප්‍රමාණයෙන් යුක්ත වූ අතර, කොන්ක්‍රීට් පහසුවෙන් කැඩිය හැකි ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) කාණුව අවසානයේ අඩි 100 - 150 දක්වා කොටසේ කාණුවේ පතුල පොළවට සමාන්තරව තරමක් උසින් ඉදි කර තිබීම හේතුවෙන් කාණුව පතුලේ ජලය ගලා යෑමට නොහැකිව පිරී තිබුණි. මේ ආකාරයෙන් ප්‍රමිතියෙන් තොර ඉදි කිරීම් සඳහා රු.250,000 ක් වැය කර තිබුණි.

### 3.6.3 උඩතැන්න පාරේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම - රු.200,000

--------------------------------------------------------------------

මෙම කර්මාන්තයේ කාණුවේ පතුල අගල් 4 ක් ඝනකමින් ඉදි කිරීමට ඇස්තමේන්තු කර එම ප්‍රමාණය සඳහා ගෙවීම් කර තිබූ නමුත්, 2015 නොවැම්බර් 06 දින ස්ථාන කිහිපයකින් කඩා පරීක්ෂා කිරීමේ දි පතුලෙහි ඝනකම අගල් 2 ක් විය. කාණුවේ පතුල සඳහා 1:2:4(මි.මී.19) සිමෙන්ති, වැලි හා ගල් මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් යෙදියයුතු වුවත්, ස්ථාන කීපයක් කඩා පරීක්ෂා කිරීමේ දී කොන්ක්‍රීට් පහසුවෙන් කැඩිය හැකි ඉතා දුර්වලව තත්ත්වයක පැවති අතර, මේ ආකාරයෙන් ප්‍රමිතියෙන් තොර ඉදි කිරිම සඳහා රු.200,000 ක් වැය කර තිබුණි.

**3.6.4 තේක්කවත්ත පාර සංවර්ධනය කිරීම රු.400,000**

(i) මෙම කර්මාන්තය අඩි 275 ක් දිගින්යුතුව අගල් 4 ක් ඝනකමින් කොන්ක්‍රීට් ඇතිරීම සඳහා ඇස්තමේන්තු කර ගෙවා ඇතත්, 2015 නොවැම්බර් 06 දින ස්ථාන කීපයක් කඩා පරීක්ෂා කිරීමේ දී එහි ඝනකම අගල් 3 ½ ක් විය.

(ii) මෙම මාර්ගය 1:2:4(මි.මි.19) සිමෙන්ති, වැලි හා ගල් මිශ්‍රණය යොදා ඉදි කිරීමට ඇස්තමේන්තු කර ගෙවීම් කර ඇතත්, මාර්ගය පළුදු කර පරීක්ෂා කිරීමේ දී කොන්ක්‍රීට් ඉතා පහසුවෙන් කැඩිය හැකි මට්ටමක පැවතුණි.

(iii) සමස්තයක් ලෙස ගත් කළ නියමිත ප්‍රමිතියෙන් බැහැරව කළ ඉදි කිරීම් සඳහා රු.399,203 ක් ගෙවා තිබුණි.

**3.6.5 තැන්නේකුඹුර පන්සල අසළින් ඇතුළට යන මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීම හා තැන්නේකුඹුර ගාමිණී මහතාගේ නිවස අසළින් යන මාර්ගය ඉදි කිරීම - අදියර 02 - රු.200,000**

(i) ව්‍යාපෘති 02 ක් ලෙස ඇස්තමේන්තු පිළියෙළ කර, ලිපිගොනු පවත්වා කොන්ත්‍රාත්කාර සමිතියත් සමග වෙන් වෙන්ව ගිවිසුම්ගතව ඇතත්, ව්‍යාපෘති දෙකේ මුළු ප්‍රතිපාදන වැය කර, එකම ස්ථානයේ පැති බැම්මක් ඉදි කර තිබුණි.

(ii) ප්‍රධාන මාර්ගයේ සිට මෙම මාර්ගය ආරම්භ වන ස්ථානයේ මාර්ගයෙහි පළල අඩි 5½ ' ක් හා අඩි 7 ½ ' ක පමණ වූ අතර, මාර්ගයේ දෙපස තාප්ප බැද මාර්ගයට මායිම්ව ගොඩනැගිලි ඉදි කර තිබුණි. එබැවින්, වාහනයක් ගමන් කිරීමට හැකි පරිදි මාර්ගය සංවර්ධනය කිරීම කළ නොහැකිවීම හේතුවෙන්, වැය කළ මුදල් නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.

**3.6.6 ප්‍රාදේශීය සභාවේ නව ගොඩනැගිල්ලේ ඉහළ මාලය ඉදි කිරීම.**

ප්‍රාදේශීය සභාවේ නව ගොඩනැගිල්ලේ ඉහළ මාලය ඉදි කිරීමේ කටයුතු වෙනුවෙන් පත් කළ තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කළ කොන්ත්‍රාත්කරුට ටෙන්ඩරය පිරි නැමීම සිදු නොකර, මුදල් කමිටුව විසින් දෙවැනියට නම් සඳහන් කළ කොන්ත්‍රාත්කරුට ටෙන්ඩර්ය පිරිනැමීම මගින් සභාවට රු.1,351,777 ක අලාභයක් සිදු වී තිබුණි.

**3.6.7 තල්වත්ත හිටිනාගහවත්ත පාර සංර්ධනය කිරීම - රු.240,131**

තල්වත්ත හිටිනාගහවත්ත පාර සංවර්ධනය කිරීම පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.250,000 ක ඇස්තමේන්තුවක් මත වැඩ නිම කර රු.240,131 ක් 2014 දෙසැම්බර් මාසයේ දී ගෙවා තිබුණි. කොන්ක්‍රීට් අතුරා වැඩ නිම කර තිබූ මෙම මාර්ගයේ කොටස් සම්පූර්ණයෙන්ම ගලවා ඉවත් කර තිබූ බව 2015 නොවැම්බර් 06 දින කරන ලද භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ අතර, මාර්ගයේ කොන්ක්‍රීට් ඉවත් කිරීම පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හෝ විධිමත් පරීක්ෂණයක් හෝ සිදු කර නොතිබුණි.

**3.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.**

සභා බල ප්‍රදේශය තුළ එකතු වන නොදිරන ද්‍රව්‍ය මිල දී ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

### 4.1 අයවැය පාලනය.

------------------

(අ) පූර්ව වර්ෂයේ දී, සංවර්ධන යෝජනා ලබා ගෙන ප්‍රමුඛතාවය සකස් කර, ඉදිරි වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට සැළසුම් කරන ව්‍යාපෘතීන් සඳහා විධිමත් පරිදි කාර්මික නිලධාරීන්ගෙන් ඇස්තමේන්තු ලබා ගෙන එකී ඇස්තමේන්තුගත වටිනාකම අනුව, අයවැය ඇස්තමේන්තු පිළියෙළ කළයුතු වුවත්, එසේ කිරීමකින් තොරව කර්මාන්ත 207 ක් සඳහා සහා අරමුදල් යොදවා සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා රු.6,500,000 ක දළ අගයක් සහිත අයවැය ඇස්තමේන්තු පිළියෙළ කර තිබුණි.

(ආ) වැය විෂයයන් 47 ක් සඳහා සළසා දී තිබුණු රු.4,813,264 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ඇ) ආදායම් විෂයයන් 13 ක් සඳහා ඇස්තමේන්තුගත රු.2,429,000 ක් වූ ආදායම් කිසිවක් උපයා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දී, ආදායම් විෂයයන් 31 ක සියයට 22 සිට සියයට 136.8 දක්වා ද, වියදම් විෂයයන් 43 ක සියයට 17 සිට සියයට 99 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වීමෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.3 සංයුක්ත සැළැස්ම හා ක්‍රියාකාරී සැළැස්ම.

---------------------------------------------

සමාලෝචිත වර්ෂය ආවරණය වන පරිදි සංයුක්ත සැළැස්මක් හා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

### 4.4 අභ්‍යන්තර විගණනය.

------------------------

අභ්‍යන්තර විගණනය පවරා තිබූ නිලධාරිනියට වෙනත් රාජකාරී ද පවරා තිබීම හේතුවෙන්, ආයතනය තුළ ප්‍රමාණවත් හා ස්වාධීන අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමේ අවස්ථාව මග හැරී තිබුණි.

### 4.5 වත්කම් කළමනාකරණය.

-------------------------------

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

-----------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) සභාව සතු වාහන 02 ක් වසරකට අධික කාලයක සිට ඌන උපයෝජිතව සභා භූමියේ ගාල් කර තිබුණි.

(ii) රු.1,625,000 ක් වටිනා වාහන 02 ක් වසකරට වැඩි කාලයක් නිෂ්කාර්යව සහා භූමියේ රඳවා තිබුණි.

(iii) අනු බෙදීම් කරන ලද ඉඩම්වලින් පොදු පහසුකම් සඳහා සභාව වෙත පැවරී තිබූ ඉඩම් කිසිදු සංවර්ධනයක් හා වැට මායිම් සකස් කිරීමක් නොකර වල් බිහි වීමට ඉඩ හැර තිබුණි.

**5. පද්ධති හා පාලනය.**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය

(ආ) ණයගැති/ණයහිමි පාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පාලනය